# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,618 — 1958 දෙසැම්බර් 19 වැනි සිකුරාද — 19.12.1958

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස—ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 1903 |
| ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ දැන්වීම් ... | 1913 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 1913 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : J 57/58 LG 35 ; R/Q 193.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥා පනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදයම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ කොටිකාවත්තේ පිහිටි කෝන්ගහවත්ත නම් ඉඩමෙන් අඩි 350ක් පමණ දිග හා අඩි 3ක් පමණ පළලැති කැබැල්ලට මායිම් :—

උතුරට : ගම්සභා පාර ;
නැගෙනහිරට : ඒ. ජී. කොර්ණේලිස් අප්පුහාමි අයිතිකම් කියන ඉඩම ;
දකුණට : මෙම ඉඩමේම ඉතිරි කැබැල්ල ;
බස්නාහිරට : කොටිකාවත්ත-වැලිකඩ පී. ඩබ්ලිව්. ඩී. පාර.

1958ක්වූ ඔක්තෝබර් මස 15 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

1903—ජේ. ඇන්. බී 9687— 946 (12/58)

අංකය : J 57/58 E 615 ; R/Q 229.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කොළඹ දිසාවේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ දෙහිවල-ගල්කිස්ස පළාත් ආණ්ඩු සභා සීමාව තුළ ගල්කිස්සේ (උතුර) පිහිටි ගාලු පාරේ වරිපනම් අංක 173/3 සහ 173/4 (කොටස) දරණ ලියනපරංගියාවත්ත, කෝන්ගහවත්ත හෙවත් නෙල්ලිගහවත්ත නම් ඉඩමෙන් පර්චස් 30ක් පමණ විශාල කැබැල්ලට මායිම් :—

උතුරට : සී. ඩී. සේරම් මහතා අයිතිකම් කියන ගාලු පාරේ වරිපනම් අංක 165/1–2 දරණ ඉඩම ;
නැගෙනහිරට : සී. ඩී. සේරම් මහතා අයිතිකම් කියන ගාලු පාරේ වරිපනම් 173/4 දරණ ඉඩමේ කැබැල්ලක් ;
දකුණට : කරත්ත පාර ;
බස්නාහිරට : නැසීගිය ඊ. එච්. සෙනෙවිරත්න මහතාගේ උරුමක්කාරයන් අයිතිකම් කියන ගාලු පාරේ වරිපනම් අංක 173/1–2 දරණ ඉඩම.

1958ක්වූ නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

අංකය : ඇල් එච්/ඒ. 1055.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ කළුතර තොටමුණේ ආදායම් පාලක නිලධාරි කොටසේ කළමුල්ල ගම්පති වසමේ කළමුල්ල නමැති ගමේ පිහිටි දෙඹයාවත්ත නමැති ඉඩමෙන් අඩි 354 × අඩි 12ක් පමණ ප්‍රමාණය ඇති ඉඩම් කොටසට මායිම් :—

උතුරට : කළමුල්ල නිවාස යෝජනා ක්‍රමය සඳහා රජයට ගැනීමට පිළියෙලකර ඇති බෝකුපරන්ගියා වත්ත නමැති ඉඩම ;
නැගෙනහිරට සහ බස්නාහිරට : ඩබ්ලිව්. ඔලිවර් සිල්වා සහ ඇම්. ඇල්. පී . සෙනෙවිරත්න යන මහතුන්ට සහ තවත් අයට අයත් ඉඩම් කොටස් ;
දකුණට : ශාන්ත අන්තෝනි ගම් සභා පාර.

අංකය : ජේ 57/58 අයි ඇෆ් 278/ඇල් එච්/ඒ. 1055.

1958ක්වූ නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරනලද පරිදි**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ මැදගම්මැද්ද ගමෙහි පිහිටි තිරුවනාගොඩවත්ත නොහොත් කිරිවනාගොඩ නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර එකක් පමණවූ පහත සඳහන් මායිම් ඇති ඉඩම් කොටස :—

උතුරට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස් ;
නැගෙනහිරට : කේ/අටබාගේ උඩගම සිංහල මිශ්‍ර පාසලේ ඉඩම (රජයේ).
දකුණට : ප්‍රසිද්ධ පාර.

අංක : ජේ57/58 ඊ 727-ඇල්.ඩී./ඒ-32.

1958 නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ දුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ බෝමුරේ ගම් මුලාදෑනි වසමේ උඩතැන්න ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් රූ. 2ක් පමණවූ පහත සඳහන් මායිම් ඇති කටුවාහේන කුඹුර නමැති සම්පූර්ණ ඉඩම:—

උතුරට : අබේරත්න බන්ඩා විසින් අයිතිවාසිකම් කියනු ලබන ගල්පොලගාවා කුඹුර;
නැගෙනහිරට : ඇල සහ වැට ;
දකුණට : රජයේ ඉඩම සහ ඊ. ඇම්. හීන්බන්ඩා විසින් අයිතිවාසිකම් කියනු ලබන කටුවාහේන ;
බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

අංක : ජේ 57/58 ඊ 669–ඇල්.ඩී./ඒ-30.

1958ක්වූ නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

අංකය : ඇල්.ඩී/සී/8.

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥ පනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ දික්ඔය ගම්මුලාදෑනි වසමේ සමර්විල්ලි ගමෙහි පිහිටි කාර්ෆැක්ස් සහ ලෙනන්ට් වතුවලින් ප්‍රමාණයෙන් අ. 2 රූ. 1 පර්. 32ක් පමණ වූ පහත සඳහන් මායිම් ඇති ඉඩම් කොටස් හය—

**කැබලි 1—කාර්ෆැක්ස්වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පා. 22ක් පමණ—**

උතුරට : ටී. පී. 48656,
නැගෙණහිරට : ටී.පී. 48656,
දකුණට : ටී.පී. 48656,
බස්නාහිරට : මු. සැ. ඒ 2015 වේ. කැබලි අංක 13.

**කැබලි 2—කාර්ෆැක්ස්වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පා. 37 පමණ—**

උතුරට : මු. සැ. ඒ 2015 වේ කැබලි 13,
නැගෙනහිරට : ටී. පී. 48656.
දකුණට : මු. සැ. ඒ 2015වේ කැබලි අංක 13,
බස්නාහිරට : මු. සැ. ඒ 2015වේ කැබලි අංක 13.

**කැබලි 3—කාර්ෆැක්ස්වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පා. 24ක් පමණ—**

උතුරට : ටී. පී. 48656,
නැගෙණහිරට : මු. සැ. ඒ 2015වේ. අංක 13.

**කැබලි 4—කාර්ෆැක්ස්වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පා. 14ක් පමණ—**

උතුරට සහ නැගෙනහිරට : ටී. පී. 48656,
දකුණට : මු. සැ. ඒ 2015 වේ, අංක 13,
බස්නාහිරට : ටී. පී. 48656.

**කැබලි අංක 5—ලෙනන්ට් වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පා. 11ක් පමණ—**

උතුරට, නැගෙනහිරට සහ බස්නාහිරට : එම ඉඩමේ කොටසක්,
දකුණට : මු. සැ. ඒ 2015 වේ, කාබලි අංක 12.

**කැබලි අංක 6—ලෙනන්ට් වත්ත—ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පා. 04 ක් පමණ—**

උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේ කොටසක්,
දකුණට සහ බස්නාහිරට : මු. සැ. ඒ 2015 වේ, කැබලි අංක 12.

අංක : ජේ. 57!58 ටී. 545.

1958ක්වූ නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

අංක : ඇල්.ඩී1308.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥ පනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ කරමඩ ගොඩපොල ගම්මුලාදෑනි වසමෙහි කරමඩ ගමෙහි පිහිටි ප්‍රමාණයෙන් අක්කර 408ක් පමණක්වූ මෙහි පහත මායිම් සඳහන් දිඹුල්ගස්මුලහේන නමැති ඉඩම් කැබැල්ල—

උතුරට : ඩී. ඇම්. බිසෝමැණිකා විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම,
නැගෙණහිරට : නැසීගිය ඒ. ඩී. අමරසිංහ මහතාගේ උරුක්කාරයින් විසින් අයිතිවාසිකම් කියනු ලබන ඉඩම,
දකුණට : ප්‍රසිඬ වැඩ දෙපාර්තමේන්තුවේ ගල්වල සඳහා වෙන්කරන ලද ඉඩම,
බස්නාහිරට : ඒ. ඇම්. හීන්බන්ඩා විසින් අයිතිවාසිකම් කියනු ලබන කුඹුර.

සම්බන්ධිත අංකය : ජේ 57/58 ටී.685—ඇල්ඩී/ඊ/12.

1958ක්වූ නොවම්බර් මස 19 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත**

**5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥ පනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

පහත සඳහන් පරිදි මායිම් වී ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ දිඹුල කෝරලේ කොටගල වසමේ කොටගල ගමේ බෝගහවත්ත වත්ත නමැති ඉඩමෙන් අක්කර 4, රූඩ් 2 පමණවූ ඉඩම් කොටසක්—

උතුරෙන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ඇල සහ එම ඉඩමේ ඉතිරි කොටසද,
නැගෙනහිරින් අඩි පාරද,
දකුණෙන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන මාර්ගයද,
බටහිරින්; ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ඕවර්සියර් නිවාස හා බෝගහවත්තට අයත් මුඩු ඉඩමද වේ.

අංකය : ජේ 57/58ඒඇජ් 139/ඇල්ඩී 1349.

1958ක්වූ ඔක්තෝබර් මස 29 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ඇල්.ඩී. 1308

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරණ ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥ පනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

පහත සඳහන් පරිදි මායිම් වී ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ආදයම් නිලධාරි කොට්ඨාශයේ තලවකැලේ වසමේ තලවකැලේ යන ගමේ පිහිටි මට්ටකැලේ නමැති වත්තෙන් අක්කර එකක් පමණවූ කොටසක්—

උතුරෙන් තලවකැලේ-සාන්ත කෝම්බි වත්ත පාරද,
නැගෙනහිරින් මට්ටකැලේවත්තට අයිති ඉඩම ද,
දකුණෙන් මට්ටකැලේ කර්මාන්තශාලාවට වැටී ඇති මාවත ද,
බස්නාහිරින් තලවකැලේ සාන්ත කෝම්බි වත්ත පාර.

අංකය : ජේ. 56 ඇස් 19.

1958ක්වූ නොවැම්බර් මස 13 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරණ ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

ගාලු දිස්ත්‍රික්කයේ, කඩවත් සතරේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ ඉහලගොඩ ගම්මුලාදෑනි වසමේ ආඩිගොඩ ගමේ පිහිටි, කාමරපිට්ටනිය වත්ත හෙවත් මහගෙදෙරවත්ත නමැති ඉඩමෙන් අ.0, රූ.2, ප.0ක් පමණ වන ප්‍රමාණය පහත සඳහන් මායිම් තුළවූ කොටස:—

උතුරට : ඉහලගොඩ, ඕ. ඇම්. එලියස් සහ ජේ. කේ. සියදෝරිස් අයිතිවාසිකම් කියන එම ඉඩමේ කොටසක් සහ ගා/ඉහලගොඩ බාලිකා පාඨශාලානුබද්ධ (රජය සතු) ඉඩම,

නැගෙනහිරට : ඉහලගොඩ, ඒ. සී. මදනායක අයිතිවාසිකම් කියන පරගොඩයකුඹුර නමැති ඉඩම,
දකුණට : ඉහලගොඩ, කේ. ඒ. සාදිරිස් දියෙස් අයිතිවාසිකම් කියන එම ඉඩමේ කොටසක්,
බස්නාහිරට : මානවිල, කේ. ආර්. අන්ද්‍රයස් ද සිල්වා අයිතිවාසිකම් කියන කෝලවෙල කුඹුර නමැති ඉඩම.

සඳහන් කළයුතු අංකය : ජේ57/58/540/ඇල්. ඒ/ඒ. 117.

1958ක්වූ ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ජේ. 57/58 ඊ 116—එල්.ඩී. 2337.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරණ ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපණතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොටස තුළ මිදිගම නැගෙනහිර ගම්මුලාදෑනි වසමේ ගුරුබැබිල ගමේ පිහිටි තුන්මුනියා මුල්ලවත්ත නමැති ඉඩමෙන් අ. 3, රූ. 1, ප. 4·93ක් පමණ විශාල බිම් කැබැල්ලක්. ඊට මායිම—

උතුරට : ගාල්ල-මාතර මහ පාර,
නැගෙනහිරට : ගම් ඉම වත්ත නමැති ඉඩම,
දකුණට : තනිගහහේන නමැති ඉඩම,
බස්නාහිරට : එම ඉඩමේ කැබැල්ලක්.

1958ක්වූ නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපණතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශකරමි.

(1) මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුවේ ආදයම් නිලධාරි කොටසේ නාදුගල ගම්මුලාදැනි වසමේ නාදුගල පිහිටි බොරලුකැටියහේන නමැති ඉඩමෙන් පර්චස් 02.60 පමණ විශාල බිම් කොටසක්. මායිම්—

උතුරට : බොරලුකැටියහේන සහ එම ඉඩමට යන පාර,
නැගෙනහිරට : කරඳකැටියහේන නමැති ඉඩම,
දකුණට : සිද්දිගෙවත්ත නමැති ඉඩම,
බටහිරට : දනට ඇති අඩි පාර සහ බොරලුකැටියහේන නමැති ඉඩම.

(2) මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුවේ ආදයම් නිලධාරි කොටසේ නාදුගල ගම්මුලාදැනි වසමේ නාදුගල පිහිටි සිද්දිගෙවත්ත නමැති ඉඩමෙන් පර්චස් 11·20ක් පමණ විශාල බිම් කොටසක්. මායිම්—

උතුරට : බොරලුකැටියෙහේන නමැති ඉඩමේ කොටසක්,
නැගෙනහිරට : සිද්දිගෙවත්ත නමැති ඉඩම,
දකුණට : සිද්දිගෙවත්ත නමැති ඉඩමෙන් කොටසක්,
බටහිරට : සිද්දිගෙවත්ත නමැති ඉඩම සහ අඩි පාර.

(3) මාතර දිස්ත්‍රික්කයේ ගඟබඩපත්තුවේ ආදයම් නිලධාරි කොටසේ නාදුගල ගම්මුලාදැනි වසමේ නාදුගල පිහිටි සිද්දිගෙවත්ත නමැති ඉඩමෙන් පර්චස් 02·60 පමණ විශාල බිම් කොටසක්. මායිම්—

උතුරට : කුමානායකට අයිති සිද්දිගෙවත්ත නමැති ඉඩමේ කොටස,
නැගෙනහිරට : සිද්දිගෙවත්ත නමැති ඉඩම,
දකුණට : සිද්දිගෙවත්ත නමැති ඉඩම සහ දනට ඇති අඩි පාර,
බටහිරට : සිද්දිගෙවත්ත නමැති ඉඩමේ ඩී. සී. ආර්. ජයවර්ධනට සහ අනික් අයට අයිති කොටස සහ අඩි පාර.

අංකය : එල් බී/2375. ජේ. 57/58 ඊ. 547.

1958ක්වූ දෙසාම්බර් මස 1 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

**1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥා පනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි.

(1) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, මැද්දෙවත්ත ගම්මුලාදැනි වසමේ, වැල්ලමඩමේ පිහිටි එගොඩවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 2 ප. 0.63 පමණ විශාල බිම් කැබැල්ලක්—මායිම්—

උතුරට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර,
නැගෙනහිරට හා බටහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි,
දකුණට : මුහුදු වෙරළ.

(2) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, මැද්දෙවත්ත ගම්මුලාදැනි වසමේ වැල්ලමඩමේ පිහිටි එගොඩවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 ප. 32.75 පමණ විශාල බිම් කැබැල්ලක්— මායිම්—

උතුරට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර,
නැගෙනහිරට : ඇල,
දකුණට හා බටහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි.

(3) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, දෙවිනුවර බටහිර ගම්මුලාදැනි වසමේ වැල්ලමඩමේ පිහිටි, කළපුමෝදරවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 2 ප. 0.9 පමණ විශාල බිම් කැබැල්ලක්. මායිම්—

උතුරට : මාතර-තංගල්ල ප්‍රසිද්ධ පාර,
නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කැබැල්ල,
දකුණට : මුහුදු වෙරළ,
බටහිරට : ඇල.

(4) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, දෙවිනුවර බටහිර ගම්මුලාදැනි වසමේ වැල්ලමඩමේ පිහිටි, කළපුමෝදරවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 ප. 21.90 පමණ විශාල බිම් කැබැල්ලක්—මායිම්—

උතුරට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර,
නැගෙනහිරට, දකුණට හා බටහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි.

(5) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, දෙවිනුවර බටහිර ගම්මුලාදැනි වසමේ, වැල්ලමඩමේ පිහිටි, කළපුමෝදරවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 ප. 4.40 පමණ විශාල බිම් කැබැල්ලක්. මායිම්—

උතුරට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර,
නැගෙනහිරට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර,
දකුණට හා බටහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි.

(6) මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුව හා කඩවත් සතර ආදයම් නිලධාරි කොටසේ, දෙවිනුවර බටහිර ගම්මුලාදැනි වසමේ, වැල්ලමඩමේ පිහිටි, කළපුමෝදරවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 ප. 6.06 පමණ විශාල බිම් කැබැල්ලක්—.මායිම්—

උතුරට හා නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කැබලි,
දකුණට හා බටහිරට : මාතර–තංගල්ල ප්‍රසිද්ධ පාර.

අංකය : ජේ. 57/58 ඊ. 109/එල්බී/2336.

1958ක්වූ නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටහිර ගිරුවා පත්තුවේ කඩිගමුව ගම්මුලාදෑනි කොට්ඨාශයේ කඩිගමුව ගමේ 239 අවසාන ගම් සිතියමේ ලොට් 36 සහ 39 දරන ඉදිකැටිය වත්ත නමැති ඉඩමෙන් රූ. 2, ප. 17, (අඩි 1100 × අඩි 24) පමණ කොටසක්. එහි මායිම් :—

උතුරට සහ දකුණට : එම ඉඩමේම ඉතුරු කොටස්,

නැගෙනහිරට : පාලන්කඩ–කඩිගමුව පාර,

බස්නාහිරට : වලස්මුල්ල–බෙලිඅත්ත මහ පාර.

අංකය : ජේ. 57/58 ඇල් ජී 332—කච්චේරියේ අංකය : ඇල් ඩී 7626.

1958ක්වූ නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සශොධිත) ආඥපනතින් සංශෝධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තිය යටතේ (1) වැනි උපවගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශකරමි :

යාපනය දිසාවේ පච්චිලාපලෙයි කරාච්චි ප්‍රාදේශීය ආදයම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ සොරම්පත්තු ගම්මුළාදනිතැනගෙ වසමේ මාසාර් ග්‍රාමයේ, පිහිටි මුළු ප්‍රමාණයෙන් අක්. 2, රූ.0, ප. 10ක් පමණැති වන්නාන්කෝච්චම් නොහොත් සම්පුතුඩල් නමැති එකට යාබදව පිහිටි ඉඩම් කැබිලි දෙකකි.

මෙකී ඉඩම්වලට—

උතුරින් : මාසාර්හි කේ. සින්නතම්බි හා එන්. කන්දයියා යන අයට බදු දී ඇති රජයේ ඉඩමද,

නැගෙනහිරන් හා දකුණින් : ගම්සභා මාවතක් ද,

බටහිරින් : එස්. සිතම්පරනාතර් හිමිකම්කියන කුඹුරුද, ටී. සෝමසුන්දරන්ට බදු දී ඇති රජයේ ඉඩමක් ද,

මායිම් මේ.

මෙ සම්බන්ධයෙන් සඳහන් කළ යුතු අංකය : ජේ 57/58 ඊ775.

1958ක්වූ නොවැම්බර් මස 22 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැණීමේ ආඥපනතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මන්නාරම් දිස්ත්‍රික්කයේ මුසලි ආදයම් පාලක නිලධාරි තැනගේ කොට්ඨාශයට අයත් කොන්ඩච්චි කොක්කු පුඩයන් ගම්මුලාදෑණි තැනගේ වසමට අයත් නාගුරන්තුන්ඩූ කඩ්ඩුපුලවූ නමැති ඉඩමේ ප්‍රමාණයෙන් අක්කර 2ක් පමණවූ කොටසක් :—

උතුරෙන් : මොහොමදූ කප්පුඩයාර් සහ අල්ලා පිච්චි සුලෙයිමන්ට අයත් ඉඩමද,

නැගෙනහිරින් : මීරසහිබු මොහොම්මදූ සැරිප් සහ අනෙක් අයගේ ඉඩමද,

දකුණෙන් : මොහොමදූ මරිකාර් අසනාර් සහිබුට අයත් ඉඩමද,

බස්නාහිරින් : ආණ්ඩුවේ ඉඩමද ගම් සභාපාරද,

අංකය : ජේ 57/58 ඊ. 229.

1958ක්වූ ඔක්තෝබර් මස 30වෙනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන පිළිබඳ ඇමති.

---

## 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතෙන් සංශෝධනයකරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් මායිම් වලින් වටවූ මඩකලපු දිස්ත්‍රික්කයේ දකුණු මන්මුණෙයි සහ එරුවිල් පෝරතිව් පත්තුවේ ආදයම් පාලක ප්‍රාදේශීය නිලධාරි තැනගේ කොට්ඨාශයේ මහිලූර් නමැති ගමේ නැගෙනහිර සිටන් වත්තේ වේනෙයි කාඩු වලව්වූ නම්වූ ඉඩමෙන් අක්කර 2ක් පමණ ගැවැසී ගත් බිම් ප්‍රමාණයට

මායිම් :—

උතුරට : ආණ්ඩුවේ ප්‍රසිද්ධ මාවත;
නැගෙනහිරට : ගම්සහා මාවත;
දකුණට : ගම්සහා මාවත;
බස්නාහිරට : වී. වෙල්ලයියා පොඩි සහ අනිකුත් අය හිමිකම් කියා සිටින ඉඩම.

යොමු අංකය : ජේ.57/58 ඊ. 477.
කච්චේරියේ යොමු අංකය : ඇල්.ඩී. 3811.

1958ක්වූ සැප්තැම්බර් මස 17 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන පිළිබඳ ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් මායිම්වලින් වටවූ මඩකලපු දිස්ත්‍රික්කයේ ආදයම් පාලක ප්‍රාදේශීය නිලධාරි තැනගේ කොට්ඨාශයේ තම්බිලුවිල් නමැති ගමේ පනෝයියඩිවලව්වූ සහ පල්ලියඩි වලව්වූ නම්වූ ඉඩම්වලින් අක්කර 2/5ක් පමණ ප්‍රමාණවූ ඉඩමට මායිම් :—

උතුරට : පටු මාවත;
නැගෙනහිරට : පොන්නාච්චි සහ අනිකුත් අය හිමිකම් කියා සිටින ඉඩම;
දකුණට : මඩකලපුවේ නැගෙනහිර තම්බිලුවිල් ආණ්ඩුවේ දෙමළ මිශ්‍ර පාසැල;
බස්නාහිරට : ආණ්ඩුවේ ප්‍රසිද්ධ මාවත.

යොමු අංකය : ජේ.57/58 ඊ. 414.

කච්චේරියේ යොමු අංකය : ඇල්.ඩී. 3805.

1958ක්වූ ඔක්තෝබර් මස 21 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන පිළිබඳ ඇමති.

---

අංකය : 3/61/58/31.

## 1954රේ අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

පහත විස්තර කරන ඉඩම මහජන කාය්‍ය්‍යයක් සඳහා අවශ්‍යයයිද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයිද ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය චාල්ස් පර්සිවල් ද සිල්වා වන මම, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත, 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි :

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුගම්පොල හත්පත්තුවේ ඉහල පොතුවැව නමැති ගමෙහි පිහිටි ගලහිටියාව කුඹුර නමැති ඉඩමෙන් අක්කර 0·27ක් පමණ විශාලත්වයක් ඇති පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් ප්‍රමාණය, ඊට—

උතුරට : ආර්. එච්. හරිස්චන්ද්‍ර විසින් හිමිකම් කියන කුඹුර (නො. 1,602 දරන අවසාන ගම්මැනීමේ සැලැස්මේ කැබැලි නො. 5න් කොටසක්)
නැගෙනහිරට : වඳුරාගල ඇල (නො. 1,602 දරන අවසාන ගම් මැනීමේ සැලැස්මේ කැබැලි නො. 34න් කොටසක්) ;
දකුණට : කළුබුළුඔය (නො. 1,602 දරන අවසාන ගම්මැනීමේ සැලැස්මේ කැබැලි නො. 1න් කොටසක්) ;
බස්නාහිරට : කළුබුළුඔය (නො. 1,602 දරන අවසාන ගම්මැනීමේ සැලැස්මේ කැබලි නො. 1න් කොටසක්).

සඳහන් අංකය : ජේ. 57/58 ඇල් 182.

1958 නොවැම්බර් මස 6 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන ඇමති.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වැනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරනු ලැබූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම හා ඉඩම සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

පහත සඳහන් මායිම් තුළ පිහිටා ඇති, හලාවත දිස්ත්‍රික්කයේ දකුණු පිටිගල් කෝරළේ උල්හිටියාවේ ගම් මුලාදෑනි තැනගේ කොට්ඨාශයට අයත් උල්හිටියාවේ අඹගහවත්ත නොහොත් දෙඹගහවත්ත නමැති ඉඩමෙන් අක්කර 10ක පමණ වපසරියකින් යුත් ඉඩම් කොටසක්;—

උතුරට : ගම් සහා පාර සහ ජස්ටිනා රණසිංහ සහ සාන්තියාගෝ ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් පාන කහටගහවත්ත නමැති ඉඩම,
නැහෙනහිරට : කෝබියස් ප්‍රනාන්දු විසින් හිමිකම් පාන දෙඹගහවත්ත සහ ජස්ටිනා රණසිංහ මහත්මිය විසින් හිමිකම් පාන කහටගහවත්ත සහ මාදන්ගහවත්ත;
දකුණට : බී. මිගල් ප්‍රනාන්දු විසින් හිමිකම් පාන තල්ගහවත්ත සහ ඩබ්ලිව්. ඩබ්ලිව්. තෝමස් ප්‍රනාන්දු විසින් හිමිකම් පාන දමින්නගහවත්ත නොහොත් පරගහවත්ත සහ එම ඉඩමේ ඉතුරු කොටස (අංක ඒ. 1,523 දරණ මු.සැ. කට්ටි අංක 1) ;
බස්නාහිරට : ඩබ්ලිව්. ඒ. පියස් ප්‍රනාන්දු විසින් හිමිකම් පාන ජම්බෝලගහවත්ත සහ කේ. ඩී. පෙරේරා සහ කේ. ජුවන් ප්‍රනාන්දු යන අය විසින් හිමිකම් පාන අඹගහවත්ත නමැති ඉඩම.

1958ක්වූ නොවැම්බර් මස 26 වැනි දින,
කොළඹදීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමති.

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනාකර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතෙන් සංශෝධනය කරන ලද 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ වාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි:

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ කෑගල්ලේ නගර සභා සීමාව තුළ අංක 6 දරණ කොට්ඨාශයේ නාගොල්ලගමේ නාගොල්ල පාරේ පිහිටි, තක්සේරු අංක 14 දරණ ''ප්‍රයිස් වලව්ව'' නමැති ඉඩමෙන් පර්චස් 14 ක පමණ විශාලත්වය ඇති කොටසක්.

උතුරට සහ නැගෙණහිරට : එම ඉඩමේම ඉතිරි කොටස්ද;
දකුණට : නාගොල්ල පාරද,;
බස්නාහිරට : නාගොල්ල පාරේ තක්සේරු අංක 15 දරණ ඇන්. ඇම්. පීටර් සිල්වාට සහ තවත් අයෙකු හිමිකම් කියන ඉඩමද මායිම් වේ.

අංකය : ජේ. 57/58 එල්.ජී.513/එල්. එම්. 5734.

1958ක්වූ දෙසැම්බර් මස 5 වැනි දින,
කොළඹ දීය.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

---

අංකය : ක්‍යු.ජී. 330.

## 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954රේ අංක 39 දරණ සංශෝධිත පනතින් සංශෝධනය කළ පරිදි, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්මේ නො ඒ.4,226. ගම : කොරලවැල්ල.

| කැබැල්ල | ඉඩමේ නම | විස්තරය | අයිතිකම් කියන අය | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 62/23 දරණ ඉඩමේ කොටසක්වූ දෙඹගහ වත්ත. පයරු ගහ වත්ත සහ කළුහබරලගහ වත්ත යන ඉඩම | පොල් ඉඩම ... | ඒ. ජේ. පී. සොයිසා මහත්මිය, ''පාම් හවුස්'', මොරටුවැල්ල, මොරටුව | 0 | 0 | 18·1 |
| 2 | එම ... | එම ... | ඒ. ජේ. පී. සොයිසා මහත්මිය ''පාම් හවුස්'', මොරටුවැල්ල, මොරටුව සහ ආරවුල්කරු : කොළඹ අග්‍රාජගුරු ප්‍රසාදීන්තුමා | 0 | 0 | 09·2 |
| 3 | කොරලවැල්ලේ පාරේ පිහිටි වරිපනම් නො. 50/1 දරණ දෙඹගහ වත්තේ කොටසක් | එම ... | ජේ. ඇප්. ඇප්. ද මැල්, ''මැලින්ද'', මොරටුව | 0 | 0 | 19·8 |
| 4 | කොරලවැල්ලේ පාරේ පිහිටි වරිපනම් නො. 48/1 දරණ දෙඹගහ වත්තේ කොටසක් | එම ... | ඩබ්ලිව්. ඇනී. බි. ප්‍රනාන්දු මහත්මිය, නො. 86, කව්ඩාන, දෙහිවල | 0 | 0 | 15·3 |
| 5 | කොරල්වැල්ලේ පාරේ පිහිටි වරිපනම් නො. 48 දරණ දෙඹගහ වත්ත සහ පයරුගහ වත්තේ කොටසක් | එම ... | ඊ. පී. සී. ද මැල්, ''මැල්තිලින'', කොරල වැල්ල, මොරටුව | 0 | 0 | 24·3 |
| 6 | කොරලවැල්ල පාරේ පිහිටි වරිපනම් නො. 62/23 දරණ දෙඹගහ වත්ත සහ කළුහබරලගහ වත්ත යන ඉඩමේ කොටසක් | ලිඳක්, වැසිකිලියක් සහ ගොඩනැගිලි 5ක් ඇති පොල් ඉඩම | ඒ. ජේ. පී. සොයිසා මහත්මිය,''පාම්හවුස්'', මොරටුවැල්ල, මොරටුව | 0 | 2 | 16·6 |

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959ක්වූ ජනවාරි මස 26 වැනි දින පෙරවරු 10ට කොළඹ කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1959ක්වූ ජනවාරි මස 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීමට ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දනුම්දිය යුතුයි.

වර්ෂ 1958ක්වූ දෙසැම්බර් මස 5 දින,
කොළඹ කච්චේරියේදීය.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩබලන අතිරේක උප ඒජන්තතුමා.

අංක : ඇල්එච්/ඒ. 551.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේ වූ දන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධිතවූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මුල් ප්ලෑනේ නො. ඒ. 4.242 කැබලි නො 1. බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, මුන්වත්තබාග පත්තුවේ ලබුගම,

| කැබලි නො. | නම | විස්තර | අයිතිකරුවෝ | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | පොට්ටදෙනිහේන නොහොත් පොට්ටදෙනිය වත්ත නොහොත් පොට්ටහේන | ස්ථිර කැසිකිලි දෙකක් හා අවුරුදු 25ක් වයස ගොරක ගස් එකක් ඇති ඉඩම | හල්තොට, ලබුගම ඇස්. පී. සූරිය ආරච්චි,ඇස්.ඒ. ජීමෝරිස් පෙරේරා, ඇස්. ඒ. සිරිවර්ධන | 0 | 0 | 31·4 |
| | | | මුළු ගණන ... | 0 | 0 | 31·4 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 පෙබරවාරි 24 වැනි දින පූ.භා. 10ට හොරන ආදයම් පාලක කාර්‍යාලයයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1959 පෙබරවාරි 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958 දෙසැම්බර් 8 වැනි දින,
කලුතර කච්චේරිය.

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

අංකය : ඇල්එච්/ඒ. 702.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වෙනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම නො. ඒ 4,247 කැබලි අංක 1—බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන් කෝරළේ, ගහබඩපත්තුවේ නාහල්ල නමැති ගම.

| කැබලි අංකය | ඉඩමේ නම | විස්තරය | හිමිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ලාවුලුගහගොඩැල්ල ... | ඉඩමේ තිබෙන අවුරුදු 20ක් පමණ වයසැති පොල්ගස් 21ක්ද, කොස් ගස් 7ක්ද, රටදෙල් ගස් 2ක්ද, වල්දෙල්ගස් 2ක්ද, ගොඩපර ගස් 13ක් ද, පුවක්ගස් එකක්ද, හල්ගස් 2ක් ද, තේ පඳුරු 763ක් ද, රබර් ගස් 40ක් ද, උළු සෙවිලි කළ ස්ථිර ගොඩනැගිල්ලක් ද වේ | නැබඩ, නාහල්ලේ වී. ඒ. ලියන් සිංඤෝ, වයි. ඩබ්ලිව්. සරෝහාමි, අයි. වී. දිලෝ නෝන, වී. පොඩිනෝන සහ විතාන ගේ සුවාරිස් අප්පුහාමි | 0 2 35·1 |
| | | | එකතුව ... | 0 2 35·1 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 පෙබරවාරි 25 වැනි දින පූ: භා. 10ට කළුතර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1959 පෙබරවාරි 17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

1958ක්වූ දෙසැම්බර් 8 වැනි දින,
කළුතර කච්චේරිය,

කේ. බී. දිසානායක,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

---

සඳහන් අංකය : ඇල්බී 2328—ජේ 57 ඇල් 371

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

මහාජන කාර්‍යයක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශෝධිතවූ 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර :—

අංක 41 දරණ අවසාන ගම් සිතියමේ නොම්මර 6 දරණ අතිරේක ප්ලෑනය.

| කැබලි අංකය | ඉඩමේ නම | ඉඩමේ විස්තර | අයිතිකම් කියනඅය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 90 | ඉහලපල්ලේපිලිමුන ... ඉහතකී ඉඩම, මාතර දිස්ත්‍රික්කයේ මොරවක් කෝරළේ වරල්ල නැමැති ගමෙහි පිහිටා තිබේ, | පාලු ඉඩම ... | ලියනගේ ජේම්ස්, අමරසිංහ හෙන්ද්‍රික්, අමරසිංහ චාර්ල්ස්, අමරසිංහ ජේම්ස්, කේ. වී. ඒ. හෙන්ද්‍රික්, කේ. වී. ඒ. හින්නිහාමි නොහොත් ලොකුහාමි, බී. ඇල්. ජේම්ස්, ඒ. සොබනහාමි, ඞී. ටී. මදරසිංහ, සී. පී. මදරසිංහ සහ ජාසිංගේ තෝමිස් සියල් ලන්ම වරල්ල පදිංචි | 0 1 0·9 |
| | | | | 0 1 0·9 |

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධකාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන්, 1959 ජනවාරි මස 26 වෙනි දින උදේ 10ට මාතර කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1959 ජනවාරි 17වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට තමන් විසින් හෝ ඔවුන්ගෙන් ලියවිල්ලකින් බලයලත් අයවලුන් විසින් හෝ ඉහතකී අන්දමට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

1958 දෙසැම්බර් මස 13 වැනි දින,
මාතර කච්චේරිය.

ඇල්. ඇන්. ද ඇල්. බන්ඩාරනායක,
මාතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

අංකය : ඇල් ඇල්/ඒ 5775

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරනලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 31 (බී) වගන්තිය යටතේ කරනු ලබන දන්වීමයි

මෙහි පහත සඳහන් උප ලෙඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට අයත් කර ගැන්ම නිසා එකී ඉඩම්වලට ගෙවනු ලබන පොලියත් සමග වන්දි මුදල් පහත සඳහන් උසාවිවල තැන්පත් කිරිම සඳහා ගෙවන ලද බවත්, ඒ මුදල් සම්බන්ධව අයිතිකම් කියන යම් අයෙකු හෝ අයවලුන් වෙත්නම් ඒවා ලබාගත යුතු බවත්, 1954 රේ අංක 39 දරන ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් ශංශොධනය කරන ලද පරිදි1950 අංක 9 දරන ඉඩම් ලබා ගැනීමේ ආඥපනතේ 31 වෙනි වගන්තියේ පරිදි රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් ලබා ගැනීමේ නිලධාරි හෙක්ටර් කරුණාජීව වන මම මෙයින් දනුම දෙමි.

1958 වෙ නොවැම්බර් මස 20 වෙනි දින,
රත්නපුරේ කච්චේරියේදීය.

එච්. කරුණාජීව,
රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන.

### උපලෙඛනය

| | ඉඩම | මුදල රු. ශත | | නඩු අංකය |
|---|---|---|---|---|
| 1. | කුරුවිට කෝරලේ උඩපත්තුවේ දකුනේ අංක 341 සහ 342 අවසාන ගම් සිති යම් වල අංක 258 බිම් කැබැල්ලට අයත් හිදෙල්ලන පිහිටි උල්පත්දෙනිය නමැති ඉඩම | 0 50 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 19 දරන නඩුව |
| 2. | කුරුවිට කෝරලේ උඩපත්තුවේ දකුනේ හිදෙල්ලන පිහිටි අංක 341 සහ 342 දරන අ. ග. සිතියම්වල 1 වෙනි අතිරේකයේ අංක 256 බිම් කැබැල්ලට අයත් කනතේගෙදරවත්ත නමැති ඉඩමෙන් 19/21 පංගුවක් | 121 01 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 20 දරන නඩුව |
| 3. | කුරුවිට කෝරලේ උඩපත්තුවේ දකුනේ ඇල්ලෙගෙදර පිහිටි අංක 341 සහ342 දරන අ. ග. සිතියම්වල 1 වැනි අතිරේකයේ දොරකඩකුඹුර නමැති ඉඩම | 387 71 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ නො. 87 දරන නඩුව |

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 31 (බී) වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීමයි

අංකය : ඇල්ඇල්/ඒ. 5666.

මෙහි පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් ආණ්ඩුවට අයත් කර ගැන්ම නිසා එකී ඉඩම්වලට ගෙවනු ලබන පොලියත් සමග වන්දි මුදල් පහත සඳහන් උසාවිවල තැන්පත් කිරිම සඳහා ගෙවන ලද බවත්, ඒ මුදල් සම්බන්ධව අයිතිකම් කියන යම් අයෙකු හෝ අයවලුන් වෙත්නම් ඒවා ලබාගත යුතු බවත්, 1954රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 31 වෙනි වගන්තියේ පරිදි රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් ලබාගැනීමේ නිලධාරි හෙක්ටර් කරුණාජීව වන මම මෙයින් දනුම් දෙමි.

එච්. කරුණාජීව,
රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන.

1958 වෙ නොවැම්බර් මස 20 වෙනි දින,
රත්නපුරේ කච්චේරියේදීය.

### උපලෙඛනය

| | ඉඩම | මුදල රු. ශ. | | නඩු අංකය |
|---|---|---|---|---|
| (1) | නවදුන් කෝරළේ මැදපත්තුවේ කොලොම්බුගම පිහිටි අංක 214 දරන අ. ග. සිතියමේ 1 වැනි අතිරේකයේ 535 දරන බිම් කැබැල්ලට අයත් එගොඩ හේන, දරඳ කුඹුරගොඩහේන, එගොඩහකොරටුවෙ වත්ත දරඳකුඹුර යන ඉඩම්වලින් 1/24 පංගුවක් | 4 16 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 24 දරණ නඩුව |
| (2) | නවදුන් කෝරළේ මැදපත්තුවේ කොලොම්බුගම අංක 214 අ. ග. සිතියමේ 1 වෙනි අතිරේකයේ 523 බිම් කැබැල්ලට අයත් ගල්මුනෝදෙනිය යන ඉඩ මෙන් 1/32 පංගුවක් | 0 37 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 23 දරණ නඩුව |
| (3) | නවදුන් කෝරළේ මැදපත්තුවේ කොලොම්බුගම පිහිටි අංක 214 අ. ග. සිතියමේ 1 වෙනි අතිරේකයේ 542 බිම කැබැල්ලට අයත් අඹගහලියද්ද, උඩුමුල්දෙනිය යන ඉඩම් වලින් 44/945 පංගුවක් | 11 62 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 21 දරණ නඩුව |
| (4) | නවදුන් කෝරළේ මැදපත්තුවේ කොලොම්බුගම පිහිටි අංක 214 අ. ග. සිතියමේ 1 වැනි අතිරේකයේ 541 බිම් කැබැල්ලට අයත් ගැටනකුඹුර යන ඉඩමෙන් 3/20 පංගුවක් | 39 74 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 22 දරණ නඩුව |
| (5) | නවදුන් කෝරළේ මැදපත්තුවේ කොලොම්බුගම පිහිටි අංක 214 අ. ග. සිතියමේ 1 වැනි අතිරේකයේ 533 බිම් කැබැල්ලට අයත් දෙල්ගහ ලියද්ද ගොඩවත්ත යන ඉඩමෙන් 3/160 න් පංගුවක් | 0 93 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 25 දරණ නඩුව |
| (6) | නවදුන් කෝරළේ මැද පත්තුවේ කොලොම්බුගම පිහිටි අංක 214 අ. ග. සිතියමේ 1 වැනි අතිරේකයේ 532 බිම් කැබැල්ලට අයත් දෙල්ගහලියද්ද යන ඉඩමෙන් 3/160 පංගුවක් | 2 04 | ... | රත්නපුරේ රික්වෙස්ට් උසාවියේ අංක 26 දරණ නඩුව |

අංකය : ඇල්ඇල්/ඒ. 5986
ජේ 56 ඊ 258

**1954රේ අංක 39 දරණ ආඥාපනතින් සංශෝධනය කල පරිදි**
**1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත**

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1954රේ අංක 39 දරන ආඥාපනතින් සංශෝධනය කල පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :—

මෙහි පහත සඳහන් ඉඩම රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට කෝරළේ පල්ලෙ පත්තුවේ ඉද්දමල්ගොඩ ගම්මුළාදැනි කොට්ඨාශයේ ඉද්දමල් ගොඩ ගමේ අංක 659 දරන ගම් සිතියමේ 1 වෙනි අතිරේකයේ පිහිටි ඉඩම මැන අවසාන කරන ලදී.

| ලොට් | ඉඩමේ නම | විස්තර | අයිතිවාසිකම් කියන අය | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|---|
| 274 | කොස්කොලවත්තගාවා වත්ත ... | අවුරුදු 35-40 රබර් අවුරුදු 35-40 රබර් ගස් 192ක් අවුරුදු 4-5 රබර් ගස් 11ක් අවුරුදු 4-5 කජු ගස් 4ක්ද අවුරුදු 3-4 ක්වූ අඹ ගස් 2ක්ද අවුරුදු 4-5 ක්වූ වෙරලුගසක්ද අවුරුදු 6-7ක්වූ කොස් ගස් 2ක් හා අඩිපාර | කේ. ඒ. සොපිනෝනා හාමිනේ, අයි. ඩී. ඒ. පී. ධනපාල, අයි. සී. ඇල්. පෙරේරා අයි. ඩී. ඊ. පී. සත්‍යපාල, අයි. ඩී. ඒ. පී. මිත්‍රපාල, අයි. ඒ. ඇස්. ස්වර්ණලතා යන සියලු දෙනම පදිංචිය අවිස්සාවේල්ලේ බන්ඩාරවත්තේය | 1 0 04·0 |

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 පෙබරවාරි මස 2 දින පෙරවරු 10 වේලාවට රත්නපුර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1959 ජනවාරි මස 26වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**සැළකිය යුතුයි :** අයිතිවාසිකම් කියන සියලු දෙනෙක්ම තමාගේ අයිතිය තහවුරු කිරීම සඳහා ඇති ලියකියවිලි විභාගයේදී මා වෙත ඉදිරිපත් කල යුතුයි.

වර්ෂ 1958ක්වූ දෙසැම්බර් මස 10 වැනි දින,
රත්නපුරේ කච්චේරියේදී.

එච්. කරුනාජීව,
ඉඩම් ලබාගැනීමේ නිලධාරි තැන
රත්නපුර දිස්ත්‍රික්කය.

---

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

**දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි**

මෙහි පහත විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් සඳහා දීමනාපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිස මාතර, කච්චේරියේ දී වර්ෂ 1959ක්වූ ජනවාරි මස 19 වෙනි දින පූ. හා. 10ට 1935හේ අංක 19 දරණ ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් මාතර ආණ්ඩුවේ ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙයින් දැනුම්දෙනු ලැබේ.

2. ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

**3. මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විභාගකළ යුතුයි.**

**ඩබ්ලිව්. ඩබ්ලිව්. ජේ. මැන්ඩිස්,**
**ඉඩම් කොමසාරිස්තැන වෙනුවට.**

**දීමට යන ඉඩමේ විස්තරය**

| ප්ලෑන් අංකය හා ගම | කැබල්ලේ අංකය | අවසරපත්‍ර දරන්නාගේ හෝ ඉල්ලුම්කරුගේ නම | ප්‍රමාණය අ. රූ. ප. |
|---|---|---|---|
| **පී. පී. 13688–පරදූව** | ... 1, 3, 8, 5 සහ 7 | ... මූදුගමුවෙ හේවාගේ ඩයිනිස්, පරදූව ... | 2 1 29 |
| **පී. පී. 13688–පරදූව** | ... 11 | ... මූදුගමුවෙ හේවාගේ දියෝනිසා, පරදූව ... | 2 0 05 |

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

අංකය: ඇල්. කේ. 304.

**රජයේ ඉඩම් රෙගුලාසිවල 21 (2) වන රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි**

මහනුවර දිස්ත්‍රික්කයේ නිළඹේ ගොවිජනපදයේ රනපතිදේවගේ පිනෝරිස් වෛද්‍යා මහතා, එම ජනපදයේ පිහිටි අංක ඒ 2,067 දරණ මූලික පිඹුරේ අංක 79 දරණ ප්‍රමාණයෙන් රූඩ 1 පර්චස් 10ක් පමණ වූ බිම් කැබැල්ල ආයුර්වේද බෙහෙත් ශාලාවක් පිහිටුවීම සඳහා බද්දකට ඉල්ලා ඇති බව මෙයින් දැනුම් දෙමි.

**2.** යෝජිත බෙහෙත්ශාලාව ඉල්ලුම් කරුවෙත වෛද්‍ය උපදෙස් සඳහා යන ජනපදවාසී බොහෝ දෙනාට ප්‍රයෝජනවත් වනු ඇත. ජනපදයට නුදුරුව බෙහෙත්ශාලාවක් නැති **බැවින් දැනට ඔවුන්ට බොහෝ දුෂ්කරතා වන්** ඇතිවේ. ළඟම පිහිටි රජයේ ආරෝග්‍ය **ශාලාව සහ බෙහෙත් ශාලාව පිළිවෙලින් සැතපුම් 8ක් සහ 4ක්** දුරින් පිහිටා **ඇත. මෙම කාරණය සඳහා** දීමට ඉඩම තිබේ. රජයේ අනිකුත් කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව මෙම බද්ද දීමට අදහස් කොට ඇත :—

(අ) කාලය අවුරුදු 5යි. මහනුවර දිසාපතිගේ සිත්ගන්නා පරිදි බෙහෙත් ශාලාවක් පිහිටුවනු ලැබුවහොත් තව අවුරුදු 5කට බද්ද අලුත් වැඩියා කිරීමට ඉඩ ප්‍රස්ථාව ඇතිව ;

(ආ) බද්ද අවුරුද්දට රු. 21 ;

(ඉ) බදුකරු විසින් බද්ද ඇරඹූ දින සිට අවුරුදු 3ක් ඇතුළත, මහනුවර දිසාපතිගේ සිත්ගන්නා පරිදි, ආයුර්වෙද බෙහෙත් ශාලාවක් සඳහා වූ ගොඩනැගිල්ලක් ඉඩමෙහි ඉදි කළ යුතුයි.;

(ඊ) බදුකරු විසින් ඉඩම ආයුර්වේද බෙහෙත් ශාලාවකට මිස අන් කරුණක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි සඳහන් දින සිට සති හයක් ඇතුළත මීට විරුද්ධව වලංගු කරුණු මා වෙත ලියා ඉදිරිපත් කලොත් මිස නැත්නම් මෙම බද්ද දෙන්නෙමි.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958.12.19 දින,
කොළඹ දීය.

අංකය : ඇල්.ජේ. 1240/ඇල්.ජී 4672.

## ආණ්ඩුවේ ඉඩම් පිළිබඳ 21 (2) දරණ රෙගුලාසිය යටතේ කරන නිවේදනයයි

අනුරාධපුර, මාන්කඩවල, යාපනය පාරේ පිහිටුවා තිබෙන ශ්‍රී පුණ්‍ය වර්ධන සමිතියේ භාරකාරයින් වන, බණ්ඩගේ හේරත් හාමි සහ උක්කු බණ්ඩගේ ජයතුහාමි යන අය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාතේ, මාන්කඩවල පිහිටි නොම්මර 162 දරණ අවසාන ගම් සිතියමේ අංක 6 දරණ රජයේ බිම් කට්ටියෙන් අක්කර 2ක් පමණ වූ බිම් කොටසක්, එහි බෞද්ධ විහාරස්ථානයක් ගොඩනැංවීම සඳහා බදු ඉල්වා ඇති බව මෙයින් නිවේදනය කරමි.

2. මෙ ස්ථානයට කිට්ටු බෞද්ධ විහාරස්ථානය පිහිටා ඇත්තේ මීට, සැතපුම් 6ක් පමණ ඈතිනි. යෝජිත මෙම පන්සල මෙහි වෙසෙන බෞද්ධ පවුල් 75ට පමණ ප්‍රයෝජන වනු ඇත. මේ සඳහා දීමට ඉඩම ඇත. එබැවින්, රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් පහත සඳහන් කොන්දේසිවලටද අනුකූලව ඉඩම බදුදීමට රජය අදහස්කර තිබේ :—

(අ) වාර්ෂික බදු මුදල : රු. 2·50 යි ;

(ආ) බදුගන්නන් විසින්, බද්ද ආරම්භ වූ දින සිට අවුරුදු 3ක් ඇතුළත අනුරාධපුර දිසාපති තුමාගේ සෑහීමට ලක්වන අයුරින්, ඉඩමෙහි අඩි 30 × 14 × 10 ප්‍රමාණයේ විහාර මන්දිරයක් ඉදිකළ යුතුයි.

(ඉ) බදු ගන්නන් විසින් මෙම ඉඩම බෞද්ධ පන්සලක් සඳහා මිස අන් කිසිවක් සඳහා නොයෙදවිය යුතුයි.

(ඊ) බදු ගන්නන් විසින් ඉහත සඳහන් විහාර මන්දිරය ඉදිකර හමසක් ඇතුළත, මහා භාරකාරතුමන් අනුමත කරනු ලබන ඔප්පුවක් පිට එය මහා සංඝරත්නය උදෙසා පූජා කළ යුතුයි. එසේ කිරීමෙන් පසු, විහාරස්ථානය භාරකරුට හෝ පාලනය කරන විහාරාධිපතීන් වහන්සේට හෝ ප්‍රස්ථානුකූලව, ඉඩම වෙනුවෙන් 99 අවුරුදු බද්දක් දෙනු ලැබේ.

3. මෙහි පහත සඳහන් දින සිට, සති හයක් ඇතුළත මෙය නොදිය යුතු බවට සෑහෙන හේතු මා වෙත ලියා ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව ඉඩම බදු දෙනු ලැබේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1958 දෙසැම්බර් මස 19 වෙනි දින,
කොළඹදීය.

---

## ආණ්ඩුවේ ඉඩම්වල ඇති වගාවේ ප්‍රයෝජනය ගැනීමේ බදු වෙන්දේසියේ විකිණීමයි

1. වර්ෂ 1959ක්වූ ජනවාරි 1වෙනි දින සිට 1959 දෙසැම්බර් 31 වෙනි දින දක්වා ඇති කාළය තුළ පහත සඳහන් උපලේඛනයට ඇතුළත් රජයේ ඉඩම් කට්ටිවල තිබෙන වගාවේ ප්‍රයෝජනය ගැනීමේ බද්ද, එම උපලේඛනයේ සඳහන් දින සහ ස්ථානවලදී වෙන්දේසිකර විකුණනු ලැබේ.

වෙන්දේසියේ ඉල්ලුම් කිරීමට අදහස් කරන අය විසින් තම ඉල්ලීම් පිළිගනු ලැබුවහොත් තමා විසින් ඉල්ලුම් කරන ලද බදු මුදල් සම්පූර්ණයෙන්ම ඒ අවස්ථාවේදී ගෙවීමට සූදනම්ව පැමිණිය යුතුයි.

3. තෝරාගනු ලැබූ බදුකරුවන් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා සමග බදු කොන්දේසි පත්‍රවලට අත්සන් කළයුතු වේ. ඉන්පසු ඉඩම් ලබාගත් අයට එම ඉඩම්වල බුත්තිය ගම්මුලාදෑනි තැන විසින් පසුව පවරා දෙනු ලැබේ.

4. බදුගත් කාල සීමාව තුළදී ඉඩමේ පිහිටි ගස්කොළන් ආදිය කපා උදුරා හෝ වෙනත් අලාභ හානි සිදුකළහොත් ඒ සඳහා වන්දි මුදල් ගැනුම්කරුවන්ට ගෙවීමට සිදුවේ.

5. වෙන්දේසියේ විකුණන ලද එම බදු ඉඩම් රජයේ උවමනාවන්ට අවශ්‍යවී තිබී වැරදීමකින් හෝ නැතහොත් වෙනයම් කරුණක් නිසා හෝ විකුණන ලද බව වැටහුනොත් දිසාපතිතුමා විසින් බදු ඔප්පුව අවලංගු කරනු ලැබේ. වෙනත් අලාභයක් හෝ ආධාර වශයෙන් හෝ යම්කිසි මුදලක් ගෙවනු නොලැබේ.

6. වැසියන්ට ඉඩම් බෙදා දීම සඳහා හෝ වෙන අවශ්‍ය කාරණයකට මෙහි සඳහන් යම් ඉඩමක් ආණ්ඩුවට ආපසු උවමනා වුවහොත්, බදුකරු ඉඩම් නිරවුල්ව ආණ්ඩුවට භාරදිය යුතුයි. එවැනි අවස්ථාවකදී ඉතිරි කාලයට ගැනෙන මුදල බදුකරුට ගෙවනු ලැබේ.

7. මේ පිළිබඳ වැඩි විස්තර ඉඩම පිහිටි ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරිතුමාගෙන් ලබාගත හැක.

1958 දෙසැම්බර් 15 වැනි දින,
රත්නපුරය.

එච්. කරුණාජීව,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙනුවට.

### උපලේඛනය

පහත සඳහන් ඉඩම් කලවානේ ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරි කාර්‍යාලයේදී ජනවාරි 6 වැනි දින සවස 2ට වෙන්දේසි කරනු ලැබේ.

| අංක | ගම | බිම් කට්ටිය | සාමාන්‍ය ප්‍රමාණය අ. | රූ. | ප. | වගාව | තක්සේරු මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අ.ග.සි. 41, ගවරගිරිය | 249,252,253 | 0 | 1 | 20 | කොස්, පොල්, දෙල් | 7 | 50 |
| 2 | එම | 139 | 0 | 2 | 0 | එම | 9 | 0 |
| 3 | අ.ග.සි. 254, වරකැල්ගොඩ | 149 | 0 | 0 | 8 | කොස්, දෙල්, දෙහි | 3 | 0 |
| 4 | අ.ග.සි. 224, පරගල | 209 | 0 | 1 | 15 | කොස් | 3 | 30 |
| 5 | එම | 57 | 0 | 0 | 12 | කොස්, පොල්, පුවක් | 5 | 25 |
| 6 | එම | 192 | 0 | 3 | 15 | එම | 9 | 72 |
| 7 | එම | 61 | 0 | 0 | 25 | කොස්, පොල් | 10 | 20 |
| 8 | අ.ග.සි. 241, පිඹුර | 57 | 0 | 1 | 0 | කොස්, පොල්, පුවක් | 5 | 40 |
| 9 | අ.ග.සි. 245, වේවැල්කඳුර | 95,98 | 1 | 0 | 0 | මිශ්‍ර වගාව | 36 | 0 |

පහත සඳහන් ඉඩම් අයගම සංචාරක බංගලාවේදී 1959 ජනවාරි 9 වෙනි දින සවස 2ට වෙන්දේසි කරනු ලැබේ:—

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 10 | අ.ග.සි. 42, අයගම | 692 | 26 | 0 | 0 | කොස්, පුවක් | 161 | 0 |
| 11 | එම | 698 | 18 | 1 | 24 | එම | 113 | 0 |

### අටකලන් කෝරලය

පහත සඳහන් ඉඩම් අටකලන්පන්නේ ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරි කාර්‍යාලයේදී 1959 ජනවාරි 7 වෙනි බදාදා සවස 2ට වෙන්දේසි කරනු ලැබේ:—

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අ.ග.සි. 606, මාදම්පෙ | 9 | 0 | 3 | 0 | පොල්, කොස් | 18 | 0 |
| 2 | අ.ග.සි. 8, නම්බුලුව | 16 | 0 | 2 | 0 | කොස්, දෙල් ආදිය | 12 | 0 |
| 3 | අ.ග.සි. 57, රක්වාන | 121 | 0 | 1 | 304 | පොල්, කොස් | 60 | 0 |

### කුරුවිටි කෝරලය

පහත සඳහන් ඉඩම් කුරුවිට ප්‍රාදේශීය ආදයම් පාලක නිලධාරි කාර්‍යාලයේදී 1959 ජනවාරි 7 වෙනි බදාදා සවස 2ට වෙන්දේසි කරනු ලැබේ :—

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | අ.ග.සි. 335, කනේගල්ල | 135 ඒ | — | | | පොල් | 0 | 50 |
| 2 | අ.ග.සි. 399, කුඩාව | 111 සී | — | | | එම | 0 | 90 |
| 3 | අ.ග.සි. 330, එක්නැලිගොඩ | 4 | 0 | 3 | 0 | එම | 10 | 0 |

## මැණික් ගැරීමේ අයිතිය වෙන්දේසියේ විකිණීමයි

රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් පහත දක්වෙන උප ලේඛනයේ විස්තර කර තිබෙන රජයේ ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිය අවුරුද්දකට බදුදීම පිණිස ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව දැනුම් දෙනු ලැබේ.

2. 1959 ජනවාරි මස 26 වෙනි දින උදේ 10 ට රත්නපුර කච්චේරියේදී වෙන්දේසිය ආරම්භ කරනු ලැබේ. අවශ්‍ය වුවහොත් පසුදිනවලදී ද වෙන්දේසිය පවත්වාගන යනු ලැබේ.

3. වෙන්දේසියේදී ඉල්ලුම් කිරීමට අදහස් කරන අය විසින් තම ඉල්ලීම පිලිගනු ලැබුවහොත් තමා විසින් ඉල්ලුම් කරන ලද මුදල් සම්පූර්ණ යෙන්ම ඒ අවස්ථාවේදී සවස 3ට පෙර ගෙවීමට සූදනම්ව පැමිණිය යුතුයි.

4. වෙන්දේසිය පවත්වනු ලබන දිනයෙහිම ඉහලම මිලයට ඉඩම ලබාගත් අය විසින් එදින සවස 3ට ප්‍රථම මුල් මුදල ගෙවිය යුතු වන අතර අතිරේක වශයෙන් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 100 ක් බැඳිය යුතුයි. එම මුදල් සඳහා කුවිතාන්සියක් ලබාගෙන බදු ඔප්පුවකට ඇතුළත් විය යුතුයි. මැණික් ගැරීමේදී කැණිය යුතු වලවල් ආදිය ගොඩ කිරීම සඳහාත් බදු ඔප්පුවේ කොන්දේසි හරියාකාර පිලිපැදීම සඳහාත් රුපියල් 100 යේ ඇප මුදල ඇප වශයෙන් තබාගනු ලැබේ.

5. ඉඩම ලබාගත් අයට ඉඩමේ බුක්තිය දිනයක් දන්වා එදිනට භාර දෙනු ලැබේ.

6. බදුගත් කාල සීමාව තුළදී ඉඩමේ පිහිටි ගස්කොලන් ආදිය කපා උදුරා හෝ වෙනත් අලාභහානි සිදුකලහොත් ඒ සඳහා වන්දි මුදල් ගෙවීමට ගැනුම්කරුට සිදුවේ.

7. ගැනුම්කරු විසින් මැණික් ගැරීමේ වැඩ කටයුතු ආරම්භ කරන දිනය ආණ්ඩුවේ ඛනිජ ද්‍රව්‍යයන් පිළිබඳ නිලධාරි තුමාට දැනුම් දිය යුතුය. උවමනා අවස්ථාවකදී එම නිලධාරි තුමාට මැණික් ගැරීමේ වැඩ පරීක්ෂාකර බැලීම පිණිස ඉඩ දිය යුතුය.

8. ඉඩම විකුණනු ලැබූ පසු එය රජයේ උවමනාවන්ට අවශ්‍යවී තිබීම හෝ වැරදීමකින් හෝ නැතහොත් වෙනයම් කරුණක් නිසා හෝ විකුණන ලද බව වැටහුනොත් දිසාපති තුමා විසින් බදු ඔප්පුව අවලංගු කරනු ලැබේ. එසේ කිරීමේදී ගැනුම්කරුට මුදල් ආපසු ගෙවනු ලැබේ. වෙනත් අලාභයක් හෝ ආධාර වශයෙන් හෝ යම්කිසි මුදලක් ගෙවනු නොලැබේ.

9. ඉඩම්වල මැණික් ඇති බවට වග කියනු නො ලැබේ.

10. මේ පිළිබඳ වැඩි විස්තර රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා ගෙන් ලබාගත හැක.

එච්. කරුණාජීව,
දිසාපති තුමා වෙනුවට.

1958 සැප්තැම්බර් මස 4 වෙනි දින,
කච්චේරිය, රත්නපුර.

ඇල්. පී. 2266.

(1) කුකුල් කෝරලේ 936 දරණ ගම් සීතියමේ පහල පොතුපිටිය නමැති ගමේ පිහිටි පොතුපිටිය ගඟ නැමැති ඇලේ දිගින් දම්වැල් 35ක තරම කොටසක්, එහි මායිම :—

උතුරට : එම ඇලේම ඉවුර ; දකුණට : එම ඇලේම ඉවුර ; නැගෙනහිරට : දුම්ගහමුල්ලේවල ; බස්නාහිරට : යාදින්නාවේ ඇල්ල.

ඇල්. පී. 2397.

(2) කුකුල් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 245 දරන ප්ලෑනේ වේවැල් කඳුර නමැති ගමේ පිහිටි ලොට් 79 දරණ කිරිල්ලගහ දෙනිය ඇල නමැති ඇලේ දිගින් දම්වැල් 16ක් පමණ ප්‍රමාණයක්, එහි මායිම් :—

උතුරට : එම ඇලේම ඉවුර ; නැගෙනහිරට : පී. ඇම්. ඩිංගිරි මහත්මයාගේ ඉඩමේ පිහිටි මායිම් ගල ; දකුණට : එම ඇලේම ඉවුර ; බස්නාහිරට : කිරිල්ල ගහ දෙනිය කුඹුරේ නැගෙනහිර මායිම.

ඇල්. පී. 2414.

(3) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 10 දරණ ප්ලෑනේ කලල්ඇල්ල නමැති ගමේ පිහිටි පනාපිටිය ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 17 ක ප්‍රමාණයක්, එහි මායිම් :—

(ඒ–බී කොටස)—

උතුරට : කිවුල් ඇල සහ ගඟ හාවෙන ස්ථානය ; නැගෙනහිරට : එම ඇලේ දකුණු ඉවුර ; දකුණට : එම ඇලේම ඉතිරි කොටස (ඒ-බී කොටස) ; බස්නාහිරට ; එම ඇලේ වම් ඉවුර.

(4) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 10 දරණ ප්ලෑනේ කලල්ඇල්ල නැමැති ගමේ පිහිටි පනාපිටිය ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 17 ක ප්‍රමාණයක්, එහි මායිම් :—

(බී-සී කොටස)—

උතුරට : එම ඇලේම ඉතුරු කොටස (ඒ-බී) කොටස ; නැගෙනහිරට : ඇලේ දකුණු ඉවුර ; දකුණට : එම ඇලේ ඉතුරු කොටස (ඩී-සී. කොටස) ; බස්නාහිරට : ඇලේ වම් ඉවුර.

(5) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 10 දරණ ප්ලෑනේ කලල්ඇල්ල නමැති ගමේ පිහිටි පනාපිටිය ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 17ක ප්‍රමාණයක්, එහි මායිම් :—

(සී-ඩී කොටස)—

උතුරට : එම ඇලේ ඉතුරු කොටස (බී-ඩී කොටස) ; නැගෙනහිරට : එම ඇලෙහි දකුණු ඉවුර ; දකුණට හඳුන්මල්දෙල සහ ගඟ හාවෙන ස්ථානය ; බස්නාහිරට : එම ඇලේම වම් ඉවුර.

ඇල්. පී. 2413.

(6) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 10 දරණ ප්ලෑනේ කලල්ඇල්ල නමැති ගමේ පිහිටි දෙමුවවත ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 16 ක ප්‍රමාණයක්, එහි මායිම් :—

උතුරට : එම ඇලේ දකුණු ඉවුර ; නැගෙනහිරට : මාදම්පේ ගම් මායිම ; දකුණට එම ඇලේම වම් ඉවුර ; බස්නාහිරට : එම ඇලේ ඉතුරු කොටස (බී–සී කොටස).

(7) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 10 දරණ ප්ලෑනේ කලල්ඇල්ල නමැති ගමේ දෙමුවවත ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 16 ක ප්‍රමාණයක්, එහි මායිම් (බී-සී කොටස) :—

උතුරට: එම ඇලේ දකුණු කොටස; නැගෙනහිරට : ඇලේ ඉතුරු කොටස (ඒ-බී කොටස) ; දකුණට : ඇලේම වම් ඉවුර ; බස්නාහිරට : එම ඇලේ ඉතුරු කට්ටිය (සී-ඩී කොටස)

(8) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 10 දරණ ප්ලෑනේ කලල්ඇල්ල නමැති ගමේ පිහිටි දෙමුවවත ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 16ක පමණ ප්‍රමාණය (සී-ඩී කොටස), එහි මායිම් :—

උතුරට : එම ඇලේ දකුණු ඉවුර ; නැගෙනහිරට : ඇලේම ඉතුරු කට්ටිය (බී-සී කොටස) ; දකුණට : ඇලේම වම් ඉවුර ; බස්නාහිරට : ඇලේම ඉතුරු කට්ටිය (ඩී-ඊ කොටස).

ඇල්. පී. 2339.

(9) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 738 දරණ දඹවින්න නමැති ගමේ පිහිටි ලොට් නො. 15 දරණ දඹවින්න ඇල නමැති ඇලේ දිගින් දම්වැල් 16ක පමණ ප්‍රමාණයක්, එහි මායිම් :—

උතුරට : බිබිලේගමට යන අඩිපාර ; නැගෙනහිරට : ඇලේ වම් ඉවුර ; දකුණට : පතන්කැටිය අමුන ; බස්නාහිරට : ඇලේ දකුණු ඉවුර.

**සැලකිය යුතුයි.**—ඒ සහ බී වශයෙන් දක්වන අමුනු දෙකේ සිට දම්වැලක දුර ප්‍රමාණයේ මැණික් ගැරීමක් නොකළ යුතුයි.

ඇල්. පී. 2303.

(10) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 221 දරණ පනාපිටිය ගමේ පිහිටි ලොට් නො. 133 සහ 160 දරණ රක්වාන ගඟ නමැති ඇලෙන් දිගින් දම්වැල් 15 ක පමණ ප්‍රමාණය ඇති කට්ටි 8 ක්, එහි මායිම් :—

උතුරට : නම්බිදෙල සහ ගඟ හා වෙන ස්ථානය ; නැගෙනහිරට : ගඟේ දකුණු ඉවුර ; දකුණට : ගඟේ ඉතුරු කොටස ; බස්නාහිරට : ගඟේ වම් ඉවුර.

ඇල්. පී. 2365.

(11) නවදුන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 184 දරණ ප්ලෑනේ කට්ටන්ගේ නමැති ගමේ පිහිටි වේ ගඟ නමැති ඇලෙන් දිගින් දම්වැල් 20 ක් පමණ ඇති ප්‍රමාණයක්, එහි මායිම් :—

උතුරට : ගං ඉම ගඟ සහ දෙල හාවෙන ස්ථානය ; නැගෙනහිරට : වේ ගඟ ඉවුර ; දකුණට : වේ ගඟේ ඉතුරු කොටස ; බස්නාහිරට : වේ ගඟේ ඉවුර.

ඇල්. පී. 2236.

(12) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 352 දරණ ප්ලෑනේ දූරෙක් කන්ද නමැති ගමේ පිහිටි ලොට් නො. 41, මුරුතන්දෙල නමැති ඇලෙන් දිගින් දම්වැල් 40 ක පමණ ප්‍රමාණයක්, එහි මායිම් :—

උතුරට : එම දෙලේ වම් ඉවුර ; නැගෙනහිරට : ඉළුක්තැන්න දෙල සහ එම දෙල යා කරන ස්ථානය ; දකුණට : එම ඇලේ ඉවුර ; බස්නාහිරට : එම දෙලේ ඉතුරු කොටස.

ඇල්. පී. 2472.

(13) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 252 දරණ ප්ලෑනේ එල්ලාවල ඉහල ගම නමැති ගමේ පිහිටි ලොට් නො. 342 දරණ එල්ලාවල ගඟ නමැති ඇලේ දිගින් දම්වැල් 26 ක පමණ ප්‍රමාණයක්, එහි මායිම් :—

උතුරට : එල්ලාවල පරන ගම ගම්සහා පාරේ පාලමේ සිට දම්වැල් 2 ක දුර ස්ථානය ; නැගෙනහිරට : එම දෙලේ ඉවුර ; දකුණට : එල්ලාවල පහලගම මායිම ; බස්නාහිරට : එම ඇලේ ඉවුර.

**සැලකිය යුතුයි.**—පාලමේ සිට දම්වැල් 2 ක ප්‍රමාණයේ මැණික් ගැරීමක් නොකළ යුතුයි.

ඇල්. පී. 2679.

(14) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 55 දරණ ප්ලෑනේ නුග දන්ඩ ඉහලගම නමැති ගමේ පිහිටි ලොට් නො. 80 කොලමැදෙවදෙනිය දෙල නමැති ඇලෙන් දිගින් දම්වැල් 10ක් පමණ ඇති ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : එම දෙලේ වම් ඉවුර ; නැගෙනහිරට : එම දෙලේ ඉතුරු කොටස ; දකුණට : එම දෙලේ දකුණු ඉවුර ; බස්නාහිරට : කෙකටිය දෙල ගහ හාවෙන ස්ථානය.

ඇල්. පී. 2642.

(15) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 659 දරණ ප්ලෑනේ කාපාවල නමැති ගමේ පිහිටි ලොට් නො. 274 නාගහ ඇල දිගින් දම්වැල් එක ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : ඇලේ වම් ඉවුර ; නැගෙනහිරට : කලුවක්පුවල ඇල ; දකුණට : එම ඇලේ ඉවුර ; බස්නාහිරට : කහටගහහේනේ මායිම.

ඇල්. පී. 2616.

(16) අටකලන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 221 දරණ ප්ලෑනේ පනාපිටිය නැමැති ගමේ පිහිටි ලොට් 160 රක්වාන ගහ නමැති ඇල දිගින් දම්වැල් 5 ක පමණ ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : එම දෙලේ දකුණු ඉවුර ; නැගෙනහිරට : කඩවලදෙල ගහ හාවෙන ස්ථානය ; දකුණට : එම දෙලේ වම් ඉවුර ; බස්නාහිරට : එම දෙලේ ඉතුරු කොටස.

ඇල්. පී. 2561.

(17) නවදුන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 214 දරණ ප්ලෑනේ කොලොම්බු ගමේ පිහිටි ලොට් 284 දරණ හංගොමු ගහේ පිහිටි අක්කර ½ ක් පමණ ඇති දූපත :—

උතුරට : එම ගහේ කොටසක්; නැගෙනහිරට : එම ගහේ කොටසක් ; දකුණට : එම ගහේ කොටසක් ; බස්නාහිරට : එම ගහේ කොටසක්.

(18) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 349 දරණ ප්ලෑනේ ගුරුලුවාන නමැති ගමේ කඳමලගම ඇලෙන් සහ ලොට් 571 දරණ හේන් යායෙන්ද මෙහි පහත සඳහන් කොටස් :—

(ඒ) කොටස : අ. 0, රූ. 3, පර්. 31

උතුරට : ලොට් 572½; දකුණට : ලොට් 571 (බී) කොටස ; නැගෙනහිරට : ලොට් 572½ ;
බස්නාහිරට : ලොට් 572½ සහ ලොට් 573.

(බී) කොටස : අ. 0, රූ. 3, පර්. ·16

උතුරට : ලොට් 573 ;
දකුණට : ලොට් 574 ;
නැගෙනහිරට : ලොට් 572½සහ (ඒ) කොටස ;
බස්නාහිරට : ලොට් 572.

ඇල්. පී. 2628.

(19) නවදුන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 81 දරණ ප්ලෑනේ අමුවල නැමැති ගමේ පිහිටි හන්ගොමු ගහ නමැති ඇලෙන් දිගින් දම්වැල් 5 ක ප්‍රමාණයක් , එහි මායිම :—

උතුරට : අවසාන ගම් සිතියම් අංක 81 දරන ප්ලෑනේ ලොට් නො. 34 ගහදිරාවත්ත මායිම ; නැගෙනහිරට : අවසාන ගම් සිතියම් අංක 81 දරණ ප්ලෑනේ ලොට් 34 සහ ගහේ දකුණු ඉවුර ; දකුණට : ආවාරිගම ඇල ; බස්නාහිරට : අවසාන ගම් සිතියම් අංක 81 දරණ ප්ලෑනේ ලොට් නො. 17 සහ ගහේ උතුරු ඉවුර.

ඇල්. පී. 2640.

(20) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 56 දරණ ප්ලෑනේ හිඳුරන්ගල නමැති ගමේ පිහිටි මහදෙල නමැති ඇලෙන් දිගින් දම්වැල් 4 ක ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : ලොට් 451ඒ සහ එම ඇලේ ඉතුරු කොටස ; නැගෙනහිරට : ඇලේ දකුණු ඉවුර ; දකුණට : ඇලේ ඉතුරු කොටස ; බස්නාහිරට: ඇලේ උතුරු ඉවුර.

ඇල්. පී. 2668.

(21) නවදුන් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 36 දරණ ප්ලෑනේ නිවිතිගල නමැති ගමේ පිහිටි වේ ගහ නමැති ඇලෙන් දිගින් දම්වැල් 8 ක ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : දූනුමඩලව ඇල මෝදර ; නැගෙනහිරට : වේ ගහේ ඉවුර ; දකුණට : මෝදර කොස් ඉන්න දෙල ; බස්නාහිරට : වේ ගහේ ඉවුර.

ඇල්. පී. 2775.

(22) කුකුල් කෝරලේ අවසාන ගම් සිතියම් අංක 224 දරණ ප්ලෑනේ පරගල නැමැති ගමේ පිහිටි ලොට් නො. 329 දරණ දිගදෙනිය දෙල නමැති ඇලෙන් දම්වැල් 5 ක ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : එම ඇලේ උතුරු ඉවුර ; නැගෙනහිරට : වටදෙනිය කුඹුර නමැති ඉඩමේ මායිම, අවසාන ගම් සිතියම් අංක 224 දරණ ප්ලෑනේ ලොට් නො. 318 සහ එම ඇලේ ඉතුරු කොටස ; දකුණට : එම ඇලේ දකුණු ඉවුර ; බස්නාහිරට : මහදෙල ගහ හාවෙන ස්ථානය සහ එම ඇලේ ඉතුරු කොටස.

ඇල්. පී. 2725.

(23) කුරුවිට කෝරලේ අවසාන ගම් සිතියම් අංක 670 දරණ ප්ලෑනේ පලිගල නමැති ගමේ පිහිටි ලොට් නො. 175 දරණ කැලේගෙදෙනිය නැමැති ඉඩමෙන් දිගින් අ. 0, රූ. 1, පර්. 35 ක ප්‍රමාණයක්, එහි මායිම :—

උතුරට : ලොට් 118 ; නැගෙනහිරට : කලේගෙදෙල ලොට් 106 ; දකුණට : ලොට් 174 ; බස්නාහිරට : ලොට් 174 සහ ලොට් 184.

## විශෙෂ නිවේදනයයි

1958 දෙසැම්බර් 25 වැනි බ්‍රහස්පතින්ද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1958 දෙසැම්බර් 26 වැනි දින නිකුත්කරනු ලබන ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1958 දෙසැම්බර් 22 වැනි සඳුදා පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1958 දෙසැම්බර් 6 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.